රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

2022.12.29

නිවේදන අංක: 880
නිකුත් කරන ලද වේලාව :14.00

ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ
අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති) / ප්‍රවෘත්ති කළමනාකරු
වෙබ් අඩවි කර්තෘ

**ගුවන් ගමනේදී සම්පූර්ණ කළ යුතු පැමිණීමේ හා පිටවීමේ කාඩ්පත**
**මාර්ගගත ක්‍රමයට සම්පූර්ණ කිරීමට අවස්ථාවක්**

2023 ජනවාරි 01 දින සිට ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයින් සහ ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන ශ්‍රී ලාංකිකයන් විසින් පුරවනු ලබන පැමිණීමේ හා පිටවීමේ කාඩ්පත (Arrival and Departure Card) මාර්ගගත ක්‍රමයට සම්පූර්ණ කිරීමට අවශ්‍ය පහසුකම් සැලසේ.

ඒ අනුව ගුවන් මගීන්ට ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ www.immigration.gov.lk නිල වෙබ් අඩවියට පිවිස හෝ https://eservices.immigration.gov.lk වෙබ් පිටුව ඔස්සේ තමා ගුවන් ගතවීමට නියමිත දිනට දින තුනකට පෙර සිට මෙම කාඩ්පත පිරවීමට පහසුකම් සපයා ඇත.

ගුවන්තොටුපළේදී ඇතිවන අපහසුතාවයන් මගහරවා ගෙන ආගමන හෝ විගමන කටයුතු පහසුවෙන් සිදුකිරීමට මගීන්ට අවශ්‍ය පහසුකම් සැලසීමේ අරමුණින් මෙම පියවර ගත් බව ආගමන හා විගමන දෙපාර්තමේන්තු පාලක ජනරාල් හර්ෂ ඉලුක්පිටිය මහතා පවසයි.

**රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**